**ශීර්ෂ 315 - උතුරු පළාත් සභාව - 2022**

**01. දැක්ම, මෙහෙවර හා කාර්යභාරය**

**1.1 දැක්ම**

උතුරේ ජනතාවගේ අපේක්ෂාවන් තෘප්තිමත් කිරීම උදෙසා යහපාලනය ක්‍රමවත්ව ක්‍රියාත්මක කිරීම මගින් ධරණීය සංවර්ධනය සහිතව සමෘද්ධිමත් බව ලඟාකර ගැනීමට අරමුණු කර ගැනීම.

**1.2 මෙහෙවර**

ජීවනෝපාය නැවත පිහිටුවීම මගින් සේවා හා යටිතල පහසුකම් නැවත සක්‍රීය කිරීම සමඟ උතුරු පළාතේ ජනතාව ඉලක්ක කර ගනිමින් යටිතල පහසුකම් පුනරුත්ථාපනය හා මානව සම්පත් සංවර්ධනය

**1.3 කාර්යභාරය**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ දහතුන්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ සමගාමී පනතේ සහ පළාත් සභා ලැයිස්තුවේ දක්වා ඇත.

**02. මූල්‍ය ප්‍රකාශන**

**මුළු ප්‍රතිපාදනය හා වියදම**

උතුරු පළාත් සභාව සඳහා සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු. මිලියන 32,682.04 ක් වූ අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු. මිලියන 31,313.77ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව ශුද්ධ ප්‍රතිපාදනයෙන් රු. මිලියන 1,368.27 ක් හෙවත් සියයට 4.19 ක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි. විස්තර පහත දැක්වේ.

| වියදම | 2022 දෙසැම්බර් 31 දිනට | | | |
|---|---|---|---|---|
| | ශුද්ධ ප්‍රතිපාදනය | උපයෝජනය | ඉතිරිය | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
| | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | |
| පුනරාවර්තන | 30,195.00 | 29,569.14 | 625.86 | 2.07 |
| මූලධන | 2,487.04 | 1,744.63 | 742.41 | 29.85 |
| **එකතුව** | **32,682.04** | **31,313.77** | **1,368.27** | **4.19** |

**03. විගණන නිරීක්ෂණ**

පාර්ලිමේන්තුව විසින් ඉහත ශීර්ෂය යටතේ ලබාදුන් ප්‍රතිපාදන පළාත් සභා අරමුදල යටතේ ගිණුම්ගත කරන ලද අතර ඒ අනුව උපයෝජනය කරන ලදි. පළාත් සභා අරමුදල පිළිබඳ විගණකාධිපති වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.